Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සතිය - 18

විෂය - ගිණුම්කරණය

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

ශ්‍රේණිය - 13

නිපුණතාව 13.0 - අනුපාත මගින් මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා අර්ථකථනය කර කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරයි.
නිපුණතා මට්ටම 13.4 - ලාභදායිත්ව අනුපාත ගණනය කර අර්ථකථනය කරයි.

ලාභදායිත්ව අනුපාත පහත පරිදි ගණනය කරයි.

1.දළ ලාභ අනුපාතය = $\frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} * 100$

2. ශුද්ධ ලාභ අනුපාතය = $\frac{\text{කාලච්ඡේදයේ ලාභය}}{\text{විකුණුම්}} * 100$

3.මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය = $\frac{\text{කාලච්ඡේදයේ ලාභය +පොලී}}{\text{මුළු වත්කම්}} * 100$

4. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය = $\frac{\text{කාලච්ඡේදයේ ලාභය}}{\text{හිමිකම්}} * 100$

1.ලාභදායී අනුපාත ගණනය කිරීමෙන් ව්‍යාපාරයට අත්වන වාසි කෙටියෙන් පැහැදිලි කරන්න.

2.සීමිත කැපිටල් පොදු සමාගමේ ගිණුම් කාලච්ඡේදය 2020/03/31 දිනෙන් අවසන් වූ වර්ෂය වේ.සමාගමේ වාර්ෂික විකුණුම් රු.500,000ක් වන අතර දළ ලාභය විකුණුම්වලින් 40%කි.පොලිය හැර මෙහෙයුම් වියදම් රු.65,000ක්ද පොලී වියදම රු.15,000ක්ද වේ.වර්ෂයේ ආදායම් බද්ද රු.30,000කි.මුළු වත්කම් රු.600,000ක් වන අතර,හිමිකම මුළු වත්කම්වලින් 75%කි.

පහත සඳහන් අනුපාත ගණනය කරන්න.

1.ශුද්ධ ලාභ අනුපාතිකය

2.මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය

3.හිමිකම මත ප්‍රතිලාභ අනුපාතිකය

ශුද්ධ ලාභය 30% ක මට්ටමක් කරා ළඟා කරවීමට නම්, ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද?